# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA


දුරකථනය
Telephone } +94 11 2758230
+94 11 2758220
ෆැක්ස්
Fax } +94 11 2801604
මගේ අංකය
My Number } ASP/02
ඔබේ අංකය
Your Number }

නුගේගොඩ,
ශ්‍රී ලංකාව.
NUGEGODA
SRI LANKA.
තැපැල් පෙට්ටිය - 6 - නුගේගොඩ.
POST OFFICE BOX - 6 - NUGEGODA.

Email : drasp@sjp.ac.lk
Web: www.sjp.ac.lk


2022.02.11

ගරු ස්වාමීන්වහන්ස
ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි

**<u>47 වැනි උපාධි ප්‍රදානෝත්සවය</u>**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 47 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2022 පෙබරවාරි මස 26, 27 සහ 28 යන දිනවල කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වනු ලැබේ. මේ වනවිට මෙම උපාධි ප්‍රදානෝත්සවයට සහභාගීවීම සඳහා සුදුසුකම් ලබා ඇති සියලුම උපාධිලාභින් දැනුවත් කරමින් ලිපි යවා ඇත.

දැනට රට තුළ පවතින කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා පනවා ඇති සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශවලට අනුව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ප්‍රධාන ශාලාවෙහි රැස්විය හැකි පුද්ගලයින් සංඛ්‍යාව සීමා කර ඇති බැවින් මෙම උපාධි ප්‍රදානෝත්සවය පහත සඳහන් ආකාරයට සැසි වාර 10 කින් පැවැත්වීමට සැලසුම් කර ඇත.

පළමුවන සැසිය - 2022 පෙබරවාරි මස 26 වැනි දින පෙ.ව. 7.30 සිට පෙ.ව 10.00 දක්වා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය සහ ශාස්ත්‍රවේදී (විශේෂ) යන උපාධි වලට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

දෙවන සැසිය - 2022 පෙබරවාරි මස 26වැනි දින පෙ.ව. 10.30 සිට ප.ව. 1.00 දක්වා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය සහ විද්‍යාවේදී තොරතුරු සන්නිවේදන තාක්ෂණ (විශේෂ) යන උපාධි වලට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

තෙවන සැසිය - 2022 පෙබරවාරි මස 26 වැනි දින ප.ව. 02.00 සිට ප.ව. 04.30 දක්වා ව්‍යවහාරික විද්‍යා පීඨයේ විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

සිව්වන සැසිය - 2022 පෙබරවාරි මස 26 වැනි දින ප.ව. 5.00 සිට ප.ව.7.30 දක්වා ව්‍යාවහාරික විද්‍යා පීඨයේ විද්‍යාවේදී (ගෞරව) උපාධිය, විද්‍යාවේදී (ගෞරව) ව්‍යාවහාරික විද්‍යා යන උපාධි වලට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

පස්වන සැසිය - 2022 පෙබරවාරි මස 27 වැනි දින පෙ.ව. 07.30 සිට පෙ.ව. 10.00 දක්වා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ වාණිජවේදී (විශේෂ) උපාධිය, විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂ) උපාධිය, විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථිකවිද්‍යා) (විශේෂ) යන උපාධි වලට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

හයවන සැසිය - 2022 පෙබරවාරි මස 27 වැනි දින පෙ.ව. 10.30 සිට පස්වරු 01.00 දක්වා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය, විද්‍යාවේදී මූල්‍ය (විශේෂ) උපාධිය, විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂ) උපාධිය යන උපාධි වලට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

හත්වන සැසිය - 2022 පෙබරවාරි මස 27 වැනි දින ප.ව. 02.00 සිට 04.30 දක්වා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂ) උපාධිය, විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ) උපාධිය, විද්‍යාවේදී මෙහෙයුම් සහ තාක්ෂණ කළමනාකරණ (විශේෂ) උපාධිය, විද්‍යාවේදී දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂ) උපාධිය, විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) උපාධිය, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) (විශේෂ) උපාධිය සහ විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (විශේෂ) යන උපාධිවලට අදාල සියලු උපාධිලාභීන් සඳහා

අටවන සැසිය - 2022 පෙබරවාරි මස 28 වැනි දින පෙ.ව. 7.30 සිට පෙ.ව.10.00 දක්වා වෛද්‍ය විද්‍යා පීඨයේ වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය, විද්‍යාවේදී මානව ජීව විද්‍යා සාමාන්‍ය උපාධිය, විද්‍යාවේදී මානව ජීව විද්‍යා ගෞරව උපාධිය, විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා ගෞරව උපාධිය, විද්‍යාවේදී හෙද ගෞරව උපාධිය සහ ඖෂධවේදී ගෞරව යන උපාධිවලට අදාල සියලුම උපාධිලාභීන්

සහ

ඉංජිනේරු පීඨයේ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

නවවන සැසිය - 2022 පෙබරවාරි මස 28 වැනි දින පෙ.ව. 10.30 සිට ප.ව. 01.00 දක්වා තාක්ෂණ පීඨයේ ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය, ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය යන උපාධිවලට අදාල සියලුම උපාධිලාභීන්

සහ

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ දර්ශනසූරි, දර්ශනපති, ශාස්ත්‍රපති, ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළබඳ විද්‍යාපති සහ කළමනාකරණ විද්‍යාපති යන පශ්චාද් යන උපාධි වලට අදාල සියලුම උපාධිලාභීන් සඳහා

දසවන සැසිය - 2022 පෙබරවාරි මස 28 වැනි දින ප.ව. 02.00 සිට ප.ව. 04.30 දක්වා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ කාර්මික ගණිතය පිළිබඳ විද්‍යාපති, කාර්මික විශ්ලේෂක රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති, පරිගණක විද්‍යාව පිළබඳ විද්‍යාපති, දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාපති, බහුඅවයවික විද්‍යාව හා තාක්ෂණය පිළබඳ විද්‍යාපති, මත්ස්‍ය හා ජලජීවී සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති, වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණය පිළිබඳ විද්‍යාපති, ව්‍යාපාර ආර්ථික විද්‍යාපති, ව්‍යවහාරික මූල්‍ය විද්‍යාපති, වෘත්තීය ගිණුම්කරණ විද්‍යාපති, ව්‍යාපාර පරිපාලන විද්‍යාපති යන පශ්චාද් උපාධි වලට අදාල සියලුම උපාධිලාභීන් සහ සියලුම පශ්චාද් උපාධි අභිඥානපත්‍ර,පශ්චාද් උපාධි සහතික පත්‍රලාභීන් සඳහා

**1.** **<u>උපාධිලෝගු සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම</u>:**

2022 පෙබරවාරි මස 19 (සෙනසුරාදා) සහ 20 (ඉරිදා) යන දිනයන්හි පෙරවරු 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා හා පස්වරු 1.00 – 4.00 දක්වා උපාධි ලෝගුව, සාටකය සහ ප්‍රවේශ පත්‍ර අදාල පීඨවලදී උපාධිලාභීන් වෙත නිකුත්කරනු ලැබේ.

උපාධි ලෝගුව ලබා ගැනීම සඳහා රු.4000/-ක ආපසු ගෙවනු ලබන තැන්පතු මුදලක් ලබා ගන්නා අතර, එම මුදල ගෙවූ බව තහවුරු කර ගැනීමෙන් පසුව (රිසිට්පත රැගෙන එන්න.) මෙම ලිපිය සමඟ ශිෂ්‍ය හැඳුනුම්පත (මෙතෙක් බාර දී නොමැති නම්) හා ශිෂ්‍ය වාර්තා පොත පීඨ කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් උපාධි ලෝගුව ලබා ගත හැකිය.

අදාළ ගෙවීම් සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ ශිෂ්‍ය ගෙවීම් පද්ධතිය වෙත පිවිස එහි ඇති ඔබට අදාල ගිණුම් අංකය භාගත කරගෙන ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදලින් ගෙවීම් කළ හැකිය. ඊට අමතරව ක්‍රෙඩිට් කාඩ්පත භාවිතයෙන් අන්තර්ජාලය හරහා ද ගෙවීම් කළ හැකිය. එසේ ගෙවීම් කර භාගත කර ගන්නා ලද මුදල් ගෙවීම් කුවිතාන්සිය 2022 පෙබරවාරි 15 දිනට පෙර සූදානම් කරගත යුතුය. ඔබට උපාධිලෝගු ලබා ගැනීමේ දී ඇතිවන අපහසුතා මඟ හරවා ගැනීම සඳහා ඉහත දිනට පෙර ගෙවීම් කරන්න.

පහත සඳහන් ආකාරයට විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස ගෙවීම් කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගත හැක.

**www.sjp.ac.lk** ➡ **For Student** ➡ **Student Payment** ➡ **Internal Student** ➡ **Enter Your NIC Number & Select Faculty** ➡ **Select 'Refundable Cloak Fee'**

උපාධි ලෝගු ලබා ගන්නා අවස්ථාවේ දී මෙම ලිපිය සමඟ එවා ඇති පහත සඳහන් අයදුම්පත් 02 ද සම්පූර්ණ කර අදාළ පීඨ කාර්යාලය වෙත බාරදිය යුතුය.

1. උපාධි ලෝගු ගාස්තු නැවත ගෙවීමේ අයදුම්පත (ඇමුණුම i)
2. උපාධිලාභීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ ප්‍රශ්නාවලිය (ඇමුණුම ii)

තවද කිසිදු හේතුවක් නිසා උපාධි ප්‍රදානෝත්සවය පවත්වනු ලබන දින තුල උපාධි ලෝගු නිකුත් කරනු නොලැබේ. උපාධි ලෝගුව නොමැතිව කිසිදු ගිහි උපාධිලාභියකුට උපාධි පෙරහැරට සහභාගී විය නොහැකිය. උපාධිලාභී භික්ෂූන් වහන්සේලා සඳහා විජිනිපත් එදින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ලබාගත හැකිය.

**2.** **<u>ඇඳුම්:</u>**

උපාධිලාභී කාන්තාවන් අභිමත වර්ණයක සාරි හෝ ඔසරිවලින් ද පිරිමි උපාධිලාභීන් ජාතික ඇඳුමින් හෝ අඩු තරමින් ටයි පටිය සහ යුරෝපීය ඇඳුමින් සැරසී සිටිය යුතුය.

**3.** **<u>පැමිණීම:</u>**

උපාධි ප්‍රදානෝත්සවය ආරම්භවීමට **<u>පැය එකහමාරකට පෙර</u>** බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට පැමිණ පෙරහැර සඳහා සූදානම් විය යුතුය.

4. **<u>උපාධි පෙරහැරේ පෙළ ගැසීම:</u>**

ගිහි පැවිදි සියලුම උපාධිලාභීන් පෙරහැරේ ගමන් කළ යුතුය. ගිහි උපාධිලාභීන් උපාධි ලෝගුව පැළඳ පෙරහැරේ පෙළ ගැසිය යුතුය. උපාධිලාභීන් පෙරහැරේ ගමන් කළ යුත්තේ උපාධිලාභී නාමලේඛනයේ සඳහන් අනුපිළිවෙලට බැවින් ඔබට ලබා දී ඇති අංක පිළිවෙලට පෙළ ගැසිය යුතුය. උපාධි සාටකය පැළඳ ගැනීම සිදුකළ යුත්තේ උපාධි සහතිකය ලබා ගැනීම සඳහා වේදිකාවට පිවිසෙන අවස්ථාවේදීය. ඉන් පසුව උපාධි ප්‍රදානෝත්සවය අවසන්වනතෙක් එය පැළඳ සිටිය යුතුය.

5. **<u>පෙරහැර අංකය පැළඳ සිටීම:</u>**

උපාධි සහතිකය නිවැරදිව ඔබට ලබා දීම සඳහා පෙරහැර අංකයක් උපාධි ලෝගුවේ අලවනු ලැබේ. එම අංකය උපාධි සහතිකය නිවැරදිව ලබා දීම සඳහා ප්‍රධාන වේදිකාවට පැමිණෙන අවස්ථාවේ දී උපාධි සාටකයෙන් නොවැසෙන පරිදි තබා ගත යුතු අතර, එය ඉතා ප්‍රවේශමෙන් අස්ථාන ගත නොවන ලෙස තබා ගැනීමට වගබලා ගත යුතුය.

6. **<u>වේදිකාව තුල දී උපාධි සහතිකය ලබා ගැනීම:</u>**

උපාධි ප්‍රදානෝත්සවය ආරම්භ කිරීමෙන් පසුව ඔබගේ නම ප්‍රකාශ වෙත්ම එම අනුපිළිවෙලට වේදිකාවට කැඳවා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ හෝ උපකුලපතිතුමා විසින් ඔබ වෙත **උපාධි සහතිකය** ප්‍රදානය කිරීමට නියමිතය.

7. **<u>උපාධි ලෝගුව සහ සාටකය ආපසු බාරදීම:</u>**

උපාධි ලෝගුව සහ සාටකය ඔබගේ උපාධි සැසිය අවසානයේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටවනු ලබන විශේෂ කවුන්ටරයට භාර දිය යුතුය. යම් හෙයකින් එලෙස බාරදිය නොහැකි වුවහොත් පහත සඳහන් දිනයන්හි දී පමණක් අදාළ පීඨ කාර්යාලයට පැමිණ උපාධි ලෝගුව සහ සාටකය භාර දිය හැකිය. නියමිත දිනට පෙර උපාධිලෝගුව බාරදීමට අපොහොසත් වුවහොත් දඩ මුදලක් අයකිරීමට සිදුවනු ඇත.

2022 මාර්තු මස 05 (සෙනසුරාදා)
2022 මාර්තු මස 06 (ඉරිදා)

උපාධි ලෝගුව සහ සාටකය භාරදෙන අවස්ථාවේ දී උපාධි ලෝගුව සඳහා ගෙවන ලද රු. 4000/- ක තැන්පත් මුදල ඔබ වෙත මුදලින් ගෙවීමට හෝ ඔබගේ ගිණුම් අංකයට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. මීට අමතරව උපාධිලෝගුවට සහ සාටකයට කිසියම් අලාභ හානියක් වී ඇත්නම් හෝ එය අස්ථානගත වී නම් එහි සම්පූර්ණ වටිනාකම ඔබට ගෙවීමට සිදුවේ.

8. **<u>ප්‍රවේශ පත්‍ර:</u>**

උපාධිලාභියෙකුට බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට ඇතුල්විය හැක්කේ නිකුත් කර ඇති ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කරන්නේ නම් පමණි. මේ සඳහා ඔබට එක් ප්‍රවේශ පත්‍රයක් ද, ඔබගේ දෙමව්පිය හෝ වෙනත් අමුත්තන් සඳහා ප්‍රවේශ පත්‍ර දෙකක් ද නිකුත් කරනු ලැබේ. මෙම ප්‍රවේශ පත්‍ර ද උපාධි ලෝගු ලබා ගැනීමට පැමිණෙන අවස්ථාවේ දී නිකුත් කරනු ලැබේ. වාහනවලින් පැමිණෙන්නන් සඳහා වාහන ප්‍රවේශ පත්‍ර ද ඒ සමඟම නිකුත් කරනු ලැබේ. වයස අවුරුදු 18 ට අඩු කිසිම අයෙකුට මෙම ප්‍රවේශපත් වලින් ශාලාවට පිවිසීමට අවසර දෙනු නොලැබේ.

**9. <u>උපාධි පිරිනැමීමේ නිමාව:</u>**

ඔබට නියමිත සැසිය අවසන් වූ වහාම ඊළඟ සැසිය සඳහා උපාධිලාභීන්ගේ පෙරහැර හා ආචාර්ය මණ්ඩලයේ පෙරහැර සංවිධානය කිරීමට බාධා හා අවහිරවලින් තොරව ඉඩකඩ සලසා ගත යුතු බැවින් ප්‍රධාන පරිශ්‍රයෙන් හා පෙරහැර පෙළ ගැසෙන ස්ථානයෙන් ඉවත් වී සහයෝගය දක්වන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිමි.

**10. <u>ඡායාරූප ලබා ගැනීම:</u>**

ඡායාරූප ලබා ගැනීම පිළිබඳ වැඩි විස්තර උපාධි ලෝගුව ලබා ගන්නා අවස්ථාවේ දී අදාළ ආයතනයේ නියෝජිතයන්ගෙන් ලබා ගත හැකිය.

මෙවර උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධි ලබා ගන්නා සියලුම උපාධිලාභීන්ගේ නාමලේඛන ඇතුලත් විශේෂ අතිරේකයක් 2022.02.27 දින Sunday observer පුවත්පත සමඟ නිකුත් කරනු ලැබේ.

දැනට රට තුල පවතින අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසා දැඩි දුෂ්කරතා මධ්‍යයේ සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශ අනුගමනය කරමින් මෙම උපාධි ප්‍රදානෝත්සවය පවත්වනු ලබන අතර එය සාර්ථක කර ගැනීම සඳහා ඉහත දක්වා ඇති උපදෙස්වලට අනුව කටයුතු කිරීමෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ජී. පියරත්න
පරිපාලන සම්බන්ධීකාරක
අධ්‍යයන, ශිෂ්‍ය කටයුතු, විභාග හා ප්‍රකාශන අංශය
ලේඛකාධිකාරී වෙනුවට.

**සැලකිය යුතුයි.**

- **දැනට රට තුළ බලපැවැත්වෙන සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර විශේෂයෙන් එකිනෙකා අතර මීටරයක දුරස්ථභාවය තබා ගැනීමත්, විධිමත් පරිදි මුඛ ආවරණ පැළඳ සිටීමත් අනිවාර්ය වේ.**

- **ශාලාවට ඇතුලුවීමේ දී <u>Covid - 19 එන්නත් මාත්‍රා දෙක</u> ලබාගත් බව සඳහන් කාඩ් පත හෝ දින තුනක් ඇතුලත ලබාගත් ප්‍රතිදේහජනක පරීක්ෂණ වාර්තාවක් (Rapid Antigen Test) ඉදිරිපත් කළ යුතුය.**

- **ඔබ සහ ඔබ සමඟ පැමිණෙන අමුත්තන් විසින් කැමරා සහ ජංගම දුරකථන යනාදිය බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව තුළට රැගෙන යාම ආරක්ෂක හේතූන් මත තහනම් කර ඇති බැවින්, ඒවා රැගෙන ඒමෙන් වළකින්න.**

- **ඉහත සඳහන් උපදෙස්වලට අනුව කටයුතු නොකරන කිසිදු පුද්ගලයකුට බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව තුලට ඇතුලු වීමට අවසර දෙනු නොලැබේ.**

Annex i

| Ref. No | |
|---|---|
| For office use only | |

# University of Sri Jayewardenepura

## Cloak Fee Refund (47th Convocation 2021)

1. Student's Name in Full :…………………………………………………..
   ……………………………………………………...
2. N.I.C. Number :…………………………………………………..
3. Registration No :…………………………………………………..
4. Faculty :…………………………………………………..
5. Department :…………………………………………………..

**Bank account details of the student (Compulsory to fill)**

6. Bank Account Number :………………………………….
7. Bank Code :………………………………….
8. Branch Code of the Bank :………………………………….

(Compulsory to annexed a copy of the bank account passbook herewith)

**Preferred method of Cloak fee refund to be collected.**

**01). Pay in cash over the university Cash counter at BMICH premises.** ☐

**02). Deposit cash in to my bank Account after the Convocation.** ☐

**Common Information.**

- **Due to COVID 19 pandemic situation, students are compulsory to fill the bank accounts details even he/she preferred to collect the cloak fee refund in cash over the cash counters at BMICH premises.**
- **Student record book together with University Identity Card or National Identity Card should be presence to identify the student.**
- **Relevant student should be presented, when he/she is intended to collect the cloak fee refund in cash over the University cash counters at BMICH premises.**

……………………………… ……………………………………..

Date Signature of the student

| යොමු අංකය | |
|---|---|
| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි | |

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## උපාධි ලෝගු ගාස්තු නැවත ගෙවීම - 47 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2021

1. ශිෂ්‍යයාගේ සම්පූර්ණ නම : ...................................................................................
2. ජාතික හැඳුනුම්පත් අංකය : ...................................................................................
3. ශිෂ්‍ය ලියාපදිංචි අංකය : ...................................................................................
4. පීඨය : ...................................................................................
5. අධ්‍යයනාංශය : ...................................................................................

**ශිෂ්‍යයාගේ බැංකු ගිණුම් විස්තර (මෙම කොටස පිරවීම අනිවාර්යය වේ)**

6. බැංකු ගිණුම් අංකය : ...................................................................................
7. බැංකු කේත අංකය : ...................................................................................
8. බැංකු ශාඛා අංකය : ...................................................................................

(බැංකු පොතෙහි මුල් පිටුවේ ඡායපිටපතක් මේ සමඟ අමුණා තිබීම අනිවාර්යය වේ.)

**මුදල් නැවත ලබා ගැනීමට කැමති ක්‍රමවේදය**

01). BMICH පරිශ්‍රයේ ඇති විශ්වවිද්‍යාලයීය කවුන්ටරයෙන් මුදල් ලබා ගනිමි ☐

02). උපාධි ප්‍රදානෝත්සවයෙන් පසු මාගේ බැංකු ගිණුමට මුදල් තැම්පත් කරන්න. ☐

**පොදු කරුණු**

- ඔබ විසින් උපාධි ලෝගු මුදල් නැවත ලබා ගැනීමේදී BMICH පරිශ්‍රයේ ඇති විශ්වවිද්‍යාලයීය කවුන්ටරයෙන් මුදල් ලබා ගැනීමට කැමති වුවද, කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් පැනනැගිය හැකි අපහසුතා මඟහරවා ගැනීමට සියලුම ශිෂ්‍යයින් විසින් බැංකු ගිණුම් විස්තර කොටස පිරවීම අනිවාර්යය වේ.
- BMICH පරිශ්‍රයේ ඇති විශ්වවිද්‍යාලයීය මුදල් කවුන්ටරය වෙත පැමිණීමේදී ශිෂ්‍යභාවය තහවුරු කරගැනීම සඳහා ශිෂ්‍ය වාර්තා පොත සමඟ විශ්වවිද්‍යාල හැඳුනුම්පත හෝ ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.
- BMICH පරිශ්‍රයේ ඇති විශ්වවිද්‍යාලයීය මුදල් කවුන්ටරයෙන් මුදල් ලබා ගැනීමේදී අදාළ ශිෂ්‍යයාම ඉදිරිපත් විය යුතු වේ.

.................................... ..................................................

දිනය ශිෂ්‍යයාගේ අත්සන

# Employability Study of Graduands - 2021

This is the **official census** for the graduands of the University of Sri Jayewardenepura, conducted jointly by the University Grants Commission and the University.

Please complete the survey questionnaire and help improve and reform the quality of higher education in Sri Lanka. The estimated time to complete the survey is less than 10 minutes. Note that your answers are anonymous and that they will be protected by law.

1. Gender: Male ☐ Female ☐
2. G.C.E. (A/L) Examination: District: ..................................... Z- Score: ......................
3. Contact details: email: ................................................Telephone: .......................
4. Faculty : ................................................ Name of the degree : ........................................................
   Eg. B.Sc. Business Administration (Buis. Economics) (Special)
   Student Registration Number: .....................................
5. Degree Type:
   ☐ General (3 Yrs) ☐ Extended (3 +1 Yrs) (Applicable only for Applied Science) ☐ Special (4 Yrs) ☐ MBBS (5 Yrs.)

   If you have select Special, Please state
   Specialization: ......................................... Degree Offered Department: ............................
6. Medium of instruction: ☐ English ☐ Sinhala ☐ Tamil
7. Class received: ☐ first Class ☐ Second Upper ☐ Second Lower ☐ General Pass
8. Final GPA value: .......................
9. English Language Proficiency
   9.1 The grades you received for **English** Language at G.C.E. (**O/L**) Exam
   ☐ A ☐ B ☐ C ☐ S ☐ F
   9.2 The grades you received for **General English** at G.C.E. (**A/L**) Exam
   ☐ A ☐ B ☐ C ☐ S ☐ F
   9.3 English Language proficiency at the University Level(as per your own understanding)

| | Poor | Average | Good | Excellent |
|---|---|---|---|---|
| Speaking | | | | |
| Listening | | | | |
| Writing | | | | |
| Reading | | | | |

10. Level of Computer Literacy
   ☐ Have not used a computer at all
   ☐ Use email regularly
   ☐ Used the computer to search for job
   ☐ Familiar with browsing the web
   ☐ Ability to use Microsoft Office Packages (Word, Excel)
   ☐ Ability to write computer programs
11. Was there an Internship Training component in your degree programme? ☐ Yes ☐ No
   If yes, please state the duration of the internship (in months) : .................

12. What is your current employment status?

- ☐ Permanent Employment
- ☐ Self Employed
- ☐ Continuing higher studies
- ☐ Temporary/ Contract Employment
- ☐ Not looking for a job
- ☐ Not employed

13. Name of the organization **currently** employed in: ............................................................

14 Which sector are you employed in?

- ☐ Public
- ☐ Foreign
- ☐ Private
- ☐ Self Employed
- ☐ Semi Government

15. The position you hold **currently**?

- ☐ University Lecturer
- ☐ Senior Level Manager
- ☐ Management Trainee
- ☐ Nurse/ Pharmacist/...
- ☐ Temporary University Academic
- ☐ Middle Level Manager
- ☐ Support Staff (Clerical/ Secretarial)
- ☐ Scientist/ Researcher
- ☐ Entrepreneur
- ☐ Doctor
- ☐ Junior Manager
- ☐ Teacher
- ☐ Other

16. To which Economic Sector does your **current job** belong to?

- ☐ Bank/ Finance
- ☐ Education
- ☐ Health Care
- ☐ Insurance
- ☐ Hotels/ Travel/ Tourism
- ☐ Public Administration & Defense
- ☐ Trade/ Manufacturing
- ☐ Construction/ Engineering
- ☐ Other
- ☐ IT

17. What is your **current** monthly gross salary (In Rupees)?

- ☐ Less than 30,000
- ☐ 50,000 – 59,999
- ☐ 30,000 – 39,999
- ☐ 60,000 – 69,999
- ☐ 40,000 – 49,999
- ☐ Over 70,000

18. Is the **current job** related to the field you studied for your degree?

○ Very Related ○ Somewhat Related ○ Neither Related nor unrelated ○ Somewhat unrelated ○ Very unrelated

19. How satisfied are you with your **current job**?

○ Very satisfied ○ Somewhat satisfied ○ Neither satisfied nor dissatisfied ○ Somewhat dissatisfied ○ Very dissatisfied

20. When did you find your current job?

- ☐ When studying at university
- ☐ After sitting final Exam
- ☐ After releasing the results

21. What are your career goals for the next two years (Mark with an ✓ to all that applies)

- ☐ Find a job
- ☐ Find a better job
- ☐ Migration
- ☐ Further Studies
- ☐ Other

22. How satisfied are you with your university education?

○ Very satisfied ○ somewhat satisfied ○ Neither satisfied nor dissatisfied ○ Somewhat dissatisfied ○ Very dissatisfied

***Thank you for completing this questionnaire. We appreciate the time you have spent in providing us with feedback that will help reform and improve the higher education of Sri Lanka.***